III වන පරිච්ඡේදය

## ආරක්ෂක තත්ත්වය පිරිහීම හා ප්‍රචණ්ඩ ක්‍රියා වැඩිවීම

**ජනතා විමුක්ති පෙරමුණ.**

ජනතා විමුක්ති පෙරමුණේ සම්භවය දක්නට ලැබෙන්නේ 1960 ගණන්වල පසු භාගයේය. මෙම පක්ෂයේ නායකයා පටබැඳි දොන් නන්දසිරි රෝහණ විජේවීර ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ පීකිං පිලේ පාක්ෂිකයෙකි. අළුතින් පිහිටුවන ලද ජනතා විමුක්ති පෙරමුණේ ( PEOPLES LIBERATION FRONT) ප්‍රාරම්භක සංවිධාන කටයුතු සිදුව තිබෙන්නේ 1967 වර්ෂයේ අග භාගයේදී කළුත්තැවේදී ය. ඊට පසු මෙම පක්ෂයේ ප්‍රධාන සංවිධාන කටයුතු මධ්‍යගතව තිබුණේ රටේ විශ්ව විද්‍යාලවලය. විශේෂයෙන්ම ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණිය මණ්ඩපය 1960 ගණන්වල අග හරියේදී ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියා ලගිලගියේ සිදුවූ ස්ථානයකි. ජනතා විමුක්ති පෙරමුණ, 1970 මහා මැතිවරණයේදී රටේ පාර්ලිමේන්තු දේශපාලනයට පිවිසීමට කිසිත් සෘජු මහන්සියක් දරා නොමැති බව පෙනෙන්නට තිබේ. 1970 මහා මැතිවරණයට සම්බන්ධ මැතිවරණ ව්‍යාපාරයේදී ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාකාරීන් රටේ බොහෝ ප්‍රදේශවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයින්ට සහයෝගය දුන් බව කවුරුත් පොදුවේ එකඟවන කරුණකි. එසේ වුවද, ජනතා විමුක්ති පෙරමුණ සෘජුව හෝ අනියමින් සම්ප්‍රදායික වාමාංශික පක්ෂවලට සහයෝගය නුදුන් බව මුල සිටම පෙනෙන්නට තිබිණ. ඇත්ත වශයෙන්ම, ඔවුන් පැරණි වාමාංශික පක්ෂවලට සතුරුව සිට ඇති බව ලබාගැනීමට තිබෙන කරුණුවලින් පෙන්නුම් කෙරේ.

නව රජය පිහිටුවනු ලැබූ විගසම ජනතා විමුක්ති පෙරමුණ සිය ප්‍රසිද්ධ රැස්වීම්වලදී රජය විවේචනය කිරීමට පටන් ගත්තේය. රජයට විරුද්ධව කැරැල්ලක් ගැසීමට එය පසුබිමෙන් සංවිධානය විය. 1971 අප්‍රේල් මස 05 වන දිනෙන් ආරම්භ කොට ජනතා විමුක්ති පෙරමුණ එකල පැවති රජයට විරුද්ධව ඇවැන්ත ප්‍රහාරයක් එල්ල කළේය. පොලිස් ස්ථාන හා ප්‍රධාන රජයේ ආයතන 100කට පමණ පහර දෙන ලදි. පොලිස් ස්ථාන සුළු සංඛ්‍යාවක් ටික කලකට පමණක් කැරලිකරුවන්ගේ අතට පත්විය. නිදහස් ලංකාවෙහි මෙබඳු කැරැල්ලක් කිසි විටෙකවත් සිදුව නැත. ( වත්මන් රජයේද අග්‍රාමාත්‍යතුමිය වන හිටපු අග්‍රාමාත්‍යතුමිය වූ සිරිමාවෝ ආර්.ඩී.බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් වූ එකල පැවති එක්සත් පෙරමුණු රජය කැරැල්ලට ප්‍රතිචාර වශයෙන් හදිසි අවස්ථා පාලනය ප්‍රකාශයට පත් කළාය. මුළු රට තුළම ටික දිනක් ඇඳිරි නීතිය ක්‍රියාත්මක විය. ඉක්බිතිව, සන්නද්ධ හමුදා හා පොලීසිය කැරලිකරුවන් විශාල සංඛ්‍යාවක් අත්අඩංගුවට ගැනීමෙන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රහාරයන්ට ප්‍රතිචාරය දැක්විය. ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර මහතා කැරැල්ල ආරම්භවීමට ප්‍රථමයෙන් අත් අඩංගුවට ගනු ලැබ කැරැල්ලේ අවසානය දක්වා යාපනේ බන්ධනාගාරයෙහි රඳවා සිටි බව සැලකිය යුතුය. 16,500ක් පමණ සංඛ්‍යාවක් කැරලිකාර ප්‍රහාරයේදී හෝ කැරලි මර්දන ප්‍රහාරයේදී මරණයට පත්වීම හෝ කැරැල්ලට සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවල යෙදීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබීම සිදුවූ බව ලබාගැනීමට තිබෙන තොරතුරුවලින් පෙන්නුම් කෙරේ.

කැරැල්ල සම්බන්ධයෙන් විමර්ශණවල යෙදුනු විමර්ශකයින් මුහුණ පෑ බොහෝ ප්‍රශ්න, කාර්ය පරිපාටිමය නීතියේ විධිවිධානවල ස්වභාවය, සාක්ෂිවල පිළිගත හැකි බව සම්බන්ධ විධි විධාන යන කරුණු සැලකිල්ලට ගෙන එකල පැවති රජය කැරලි සැකකරුවන් සම්බන්ධ නඩු ඇසීමට හා නිශ්චය කිරීමට නව නෛතික විනිශ්චය සභාවක් හඳුන්වා දුන්නේය. මෙය සිදුකරන ලද්දේ 1972 අප්‍රේල් මාසයේදී අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත පැනවීම වශයෙනි. කැරැල්ලට අදාලව හදිසි අවස්ථා රෙගුලාසි විධිවිධාන යටතේ අත්අඩංගුවට ගෙන රඳවාගෙන සිටින පුද්ගලයින් සම්බන්ධ නඩු විනිශ්චය කර නිශ්චය කිරීමට මෙම ස්ථිර කොමිෂන් සභාවට නීත්‍යානුකූල බලය පවරන ලදි. මෙම යුගයේ පත්කල වෙනත් කොමිෂන් සභාවලට මෙන් නොව මෙම කොමිෂන් සභාවට වරදකරුවන් වන පුද්ගලයින් සම්බන්ධයෙන් දණ්ඩණ අයිතිය ක්‍රියාත්මක කිරීමට ( දඩුවම් පැනවීමට) බලය තිබිණ. නීතියේ සුවිශේෂ වූ එක් විධිවිධානයක් නම්, සැකකරුවන් විසින් පොලිස් නිලධාරීන්ට ( ඔවුන්ගේ පදවියේ තත්ත්වය නොතකා) කරන ප්‍රකාශ ( පාපෝච්චාරණද ඇතුළුව) සාක්ෂි වශයෙන් පිළිගැනීමට කොමිෂන් සභාවට බලය පවරා තිබීමය. විනිමය පාලන රෙගුලාසි උල්ලංඝනය හා විදේශ විනිමය නීති විරෝධී ලෙස රටින් බැහැරට ගෙන යෑම කරන ලදැයි චෝදනා ලැබ සිටි යම් යම් පුද්ගලයින්ට විරුද්ධව මෙම කොමිෂන් සභාව විසින්ම පරීක්ෂා කර බලන ලද බව සැලකිල්ලට ගතයුතුය. අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව එහි පරීක්ෂණ කටයුතු 1972.07.22 වන දින අරඹා නඩු විමසීම 1974.12.20 වන දින දක්වා සිදුකර ගෙන ගියේය. රජය පෙරළීමට කුමන්ත්‍රණය කිරීම, යුද්ධ කිරීම ආදී වැරදි කිරීම ගැන පුද්ගලයින් හතලිස් එක් (41) දෙනෙකුට චෝදනා නඟා ලදි. ජනතා විමුක්ති පෙරමුණේ නායකයා 13 වන චූදිතයා විය. සමහර චූදිතයින් වෙනුවෙන් නීතිඥයින් පෙනී සිටි අතර, විජේවීර තම නිදහසට තමන්ම කරුණු ඉදිරිපත් කළේය. පැමිණිල්ල මෙහෙයවන ලද්දේ ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ විශේෂ චෝදකයින් කණ්ඩායමක් විසිනි. ඊට එවකට රජයේ නඩු අධ්‍යක්ෂවූ රංජිත් අබේසූරිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ තිලක් මාරපන, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සරත් එන්. සිල්වා යන මහත්වරු අයත් වූහ. (අවසානට සඳහන් කළ මහතුන් දෙදෙනා ශ්‍රී ලංකාවේ ඇටෝර්නි ජනරාල්වරුන් වූහ). 1974.12.20 වන දින කොමිෂන් සභාව චූදිතයින් 36 දෙනෙකු වරදකරුවන් කරමින් තීන්දුව දුන්නේය. වරදකරුවූ චූදිතයෝ අත්හිටවූ සිර දඬුවම් කාලසීමාවන්හි සිට 12 වසරක සිර දඬුවම් දක්වා වන සිර දඬුවම්වලට යටත් කරනු ලැබූහ. මෙ අනුව ජනතා විමුක්ති පෙරමුණේ ඉහළම නායකත්වය දැරූ පුද්ගලයෝ සියළුදෙනා බන්ධනාගාර ගත කරනු ලැබූහ. ඔවුහු එක්සත් පෙරමුණු රජයේ ආණ්ඩු කාලය අවසන්වන තුරුම බන්ධනාගාර ගතව සිටියහ. —

පක්ෂ නායකත්වය සිර අඩස්සි ගත කරනු ලැබූවද 1970 ගණන්වල මැද භාගය වන විට පක්ෂය ප්‍රතිසංවිධානයවීම ආරම්භවූ බව ලබාගැනීමට තිබෙන විස්තර කරුණුවලින් පෙන්නුම් කෙරේ. වර්ෂ 1977 මහ මැතිවරණය ප්‍රකාශයට පත්කල අවස්ථාවේ ජනතා විමුක්ති පෙරමුණේ පර්යන්ත පෙදෙස් නායකයින් ක්‍රියාශීලීව සිටි අතර, ඔවුහු එම කාලසීමාවේ දක්ෂිණාංශික ධනවාදී දේශපාලන බලවේගයක් ලෙස වර්ග කරනු ලැබ සිටි එක්සත් ජාතික පක්ෂයට ඇත්ත වශයෙන්ම එළිපිටම කෙලින්ම සහයෝගය දීමට ඉදිරිපත් වූහ. බලාපොරොත්තු වූ පරිදිම 1977 ජූලි මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තු ආසන ගණනින් 4/5 පංගුවක්ම ලබාගනිමින් බලයට පැමිණියේය. එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි විගසම, එනම්, 1977 ඔක්තෝබර් මාසයේදී රජය අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත අවලංගු කරමින් පාර්ලිමේන්තුවට කෙටුම්පත් පනතක් ඉදිරිපත් කළේය. මෙම නීතිය සම්මත කිරීමත් සමඟ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවේ නියෝග පිට සිරගත කරනු ලැබ සිටි

සියළුදෙනා බන්ධනාගාරයෙන් මුදාලනු ලැබූහ. මෙසේ ඔවුන් සිර අඩස්සියෙන් මුදාලනු ලැබුවේ එකල අග්‍රාමාත්‍යවරයා වූ ජේ.ආර්.ජයවර්ධන මහතා විසින් දෙන ලද උපදෙස් ප්‍රකාර, එවකට වූ අග්‍රාණ්ඩුකාරතුමා විසින් දෙන ලද ක්ෂමාවක් යටතේය. මේ අනුව 1977 නොවැම්බර් මස 02 වන දින රෝහණ විජේවීර බන්ධනාගාරයෙන් නිදහස් කරනු ලැබිණ. රෝහණ විජේවීර හා ඔහුගේ කණ්ඩායම නිදහස් කිරීමට හේතුවූ කරුණු හොඳාකාරවම දනිතැයි සිතිය හැක්කේ අදාල තීරණය ගත් අයමය. අග්‍රාමාත්‍ය ජේ.ආර්. ජයවර්ධන මහතා දේශපාලන විශ්ලේෂක රොහාන් ගුණරත්න මහතා සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවකදී පවසා ඇත්තේ "ඔවුන් අපරාධකරුවන් නොව දේශපාලන සිරකරුවන් නිසා" මුදාලන ලෙ ස තමන් අග්‍රාණ්ඩුකාරවරයාට උපදෙස් දුන් බවය. " මා ඔහු නිදහස් නොකලේ නම්, ඔහු නෙල්සන් මැන්ඩෙලා වැනි අයෙකු වන්නට ඉඩ තිබුනා" යයි ඔහු තවදුරටත් පවසා තිබේ. එසේ වුවත් මෙම පියවරෙන් ප්‍රයෝජනය ලත් එක් ප්‍රධාන තැනැත්තකු කියා තිබෙන්නේ මෙයයි: "ශිෂ්‍යයින් හා බාල පරපුර ස්ථිරව අප පසු පස සිටිනවා. ඔවුන්ගේ කෑගැසීමත්, අපරාධ යුක්ති විනිශ්චය සහා පනත යටතේ එක්සත් ජාතික පක්ෂයේ හිතවත් ආධාරකරුවන් කිහිපදෙනෙකු සිර අඩස්සිගත කොට සිටීමත් අප සියල්දෙනාම නිදහස් කිරීමට රජය පෙලඹීමට හේතුවුනා" යයි රෝහණ විජේවීර කියා ඇත. (1978 ජූලි මස 09 වන දින " වීක් එන්ඩ් සන්" පත්‍රය බලන්න.) එසේ වුවද, රෝහණ විජේවීර හා අන් අය නිදහස් කිරීම ගැන පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර බණ්ඩාරනායක මහතා කීවේ මෙයයි. " අප (මෙයින් කියැවෙන්නේ 1970 එක්සත් පෙරමුණු රජයයි) ඔවුන් ගැන නීත්‍යානුකූලව ක්‍රියා කළා. ඔවුන් බන්ධනාගාරගත කිරීම උසාවියෙන් නියම වුනා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විනාශ කිරීමේ ඔහුගේ උපාය මාර්ගයේ කොටසක් ලෙසට ජනාධිපති ජයවර්ධන ජේ.වී.පී. නායකයින් නිදහස් කළා. ඔවුන් ( ජනතා විමුකිත් පෙරමුණ ) තමන් බන්ධනාගාරගත කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධවනු ඇතැයි ඔහු සිතුවා. මෙම උපාය මාර්ගය ඉතා නරක අන්දමට ආපසු කැරකී වැදුනා. ජේ .වී.පී. ය ඔවුන්ටත් විරුද්ධව නැගී සිටියා". (බණ්ඩාරනායක මහතා 1980 වර්ෂ අග හරියේදී දේශපාලන විශ්ලේෂක රොහාන් ගුණරත්න මහතා සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකිනි.)

ජනතා විමුක්ති පෙරමුණ 1978 දි නිදහස ලැබූ විගසම ඔවුහු පක්ෂය ප්‍රතිසංවිධානය කිරීමට පටන් ගත්හ. ඔවුන්ගේ ප්‍රතිසංවිධානයේ ස්වභාවය ඔවුන්ගේ මැයි දින පෙලපාලි වලින් හා රැස්වීම් වලින් පැහැදිලිව පෙනිණ. පහරදීමේ ප්‍රධාන තේමාවන්ගෙන් එකක් වූයේ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ රජය 1971 කැරැල්ල යටපත් කළ ආකාරය මහජනයාට මතක් කොට දීමය. ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට ප්‍රවිෂ්ටව පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය ගැන අවංකවම උනන්දුවන ලකුණු පෙන්නුම් කළේය. 1978 පළාත් පාලන ඡන්ද විමැසීමට අපේක්ෂකයින් ඉදිරිපත් කිරීමට ඔවුන් තැත් කිරීමෙන් මෙය පැහැදිලිව පෙනිණ. කෙසේ වුවද, ඔවුහු ඉතා දුෂ්කර කටයුත්තකට මුහුණපෑහ. ජනතා විමුක්ති පෙරමුණ ලියාපදිංචි කළ දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදී. විධායකයෙන් පලවූ මෙබඳු ප්‍රතිචාරයන් ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට පිවිස එහි රැඳී සිටීමෙන් වලක්වන කරුණක් වන්නට ඇත යන අදහස පලව තිබේ. තවද. මෙම කාලසීමාවේදී ජනතා විමුක්ති පෙරමුණ ``දේශපාලන මැරවරයින්ගෙන්'' උද්ගතවන බොහෝ ප්‍රශ්නවලට මුහුණ පෑවේය. එක් අවස්ථාවක ජීප් රථයකින් හා ලං.ග.ම. බස්රථයකින් කණ්ඩායමක් පැමිණ කොළඹ විශ්ව විද්‍යාලයේ සෞන්දර්යය අධ්‍යයන ආයතනයෙහි පිහිටි පක්ෂ කාර්යාලයේ සිටි පක්ෂ ක්‍රියාකාරීන්ට පහරදී දේපොලවලට හානි කරන ලදී. බලසම්පන්න බලවේගයන්ගෙන් පැන නගින විරුද්ධත්වය වැඩිවෙමින් තිබිණද, 1981 දී පළමුවරට පැවති දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්ද විමසීම්වලට ජනතා විමුක්ති පෙරමුණ

අපේක්ෂකයින් ඉදිරිපත් කළේය. කොළඹ නගරයේ පමණක් ඔවුන්ගේ අපේක්ෂකයින්ට 8%ක ඡන්ද ප්‍රතිශතයක් ලැබිණ. ඇත්ත වශයෙන් ඇතැම් යම් යම් ප්‍රදේශවල ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කරන ලද අපේක්ෂකයෝ තෝරාගනු ලැබූහ. 1982 ඔක්තෝබර් 20 වන දින ශ්‍රී ලංකාවේ පළමුවරට පැවති ජනාධිපතිවරණය පැවැත්වින. පිළිගත් දේශපාලන පක්ෂවලින් ඉදිරිපත්වූ අපේක්ෂකයෝ හය දෙනෙක් ඡන්ද විමසීමේදී තරඟ වැදුනහ. එවකට ජනාධිපති නනතුර දැරූ ජේ.ආර්. ජයවර්ධන, හෙක්ටර් කොබ්බෑකඩුව, ආචාර්ය කොල්වින් ආර්.ද සිල්වා, කුමාර් පොන්නම්බලම් , වාසුදේව නානායක්කාර, රෝහණ විජේවීර යන අය එම හයදෙනා වූහ. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා ඡන්ද විමසීමෙන් ජයගත් අතර, සම්ප්‍රදායික වාමාංශික පක්ෂවල අපේක්ෂකයින් පරදවමින් රෝහණ විජේවීර තුන්වැනි ස්ථානය ලබාගත්තේය. පක්ෂයක් ලෙසට ජේ.වී.පී.යට පාවිච්චි කළ ඡන්දයෙන් 4.19% ලැබිණ. ජනතා විමුක්ති පෙරමුණ ශක්තියෙන් වැඩීම මෙයින් පෙන්නුම් කෙරිණි.

1982 දෙසැම්බර් මස 22 වන දින මෙරට පළමුවරට පැවැත්වූ ජනමත විචාරණය පැවැත්විණි. මෙහිදී අසන ලද ප්‍රශ්නය වූයේ මහ මැතිවරණයක් පැවැත්වීමට නොගොස් එවකට පැවති පාර්ලිමේන්තුවේ ජීවිත කාලය දීර්ඝ කිරීමට ජනතාව කැමතිද යන්නය. සියළුම දේශපාලන පක්ෂ මෙම ජනමත විචාරණයට උද්‍යෝගයෙන් තරග වැදුනහ. පාලක එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීමට උද්ඝෝෂණය කළ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කොමියුනිස්ට් පක්ෂය , ලංකා සමසමාජ පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ ආදී වාමාංශික පක්ෂත් ඊට විරුද්ධව උද්ඝෝෂණ කළහ. සුළු බහුතරයකින් ( ලියාපදිංචි කළ ඡන්ද දායකයින් අතුරින් 75.8%ක් ඡන්දය පාවිච්චි කොට තිබුණු අතර, "පක්ෂව" 54.7%ක් ද, "විරුද්ධව" 45.3ක් ද ඡන්දය පාවිච්චි කර තිබුණි.) මහා මැතිවරණයක් නොපවත්වා පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීමට තීරණය කරන ලදි.

1983 මැයි මාසයේදී රජය ජනමත විචාරණයේදී පරාජය වූ මැතිවරණ කොට්ඨාසවල අතුරු මැතිවරණ පැවැත්විය. මහ මැතිවරණයක් නොපැවැත්වූ හෙයින් මෙම අතුරු මැතිවරණ " කුඩා මහමැතිවරණයක්" මෙන් සලකන ලදි. සියළුම දේශපාලන පක්ෂ විසින් මීට ලොකු උනන්දුවක් යොමු කරනු ලැබිණ. ආසන 18ක අතුරු මැතිවරණ පවත්වන ලදි. එක්සත් ජාතික පක්ෂය ආසන 14කත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 03කත්, මහජන එක්සත් පෙරමුණ 01 ආසනයකත් ජය ලැබිය. ජනතා විමුක්ති පෙරමුණු අපේක්ෂකයින්ට සැලකියයුතු ඡන්ද ප්‍රමාණයක් ලැබිණ. අතුරු මැතිවරණ පැවැත්වූ විගස රජය රටේ හදිසි අවස්ථාව ප්‍රකාශ කළේය.

ජනමත විචාරණය පැවැත්වූ ආකාරය ගැනත් ඇතැම් බලසම්පන්න බලවේග ඡන්ද විමැසීමට පෙරාතුව වූ කාලසීමාවෙහි මෙන්ම ඡන්ද විමසීම පැවැත්වූ දින හැසිරුණු ආකාරය ගැනත් පැවති මතභේදයේ ප්‍රතිඵලය ලෙසට 1983 පෙබරවාරි මාසයේදී ජනතා විමුක්ති පෙරමුණේ නායකයා ජනමත විචාරණයේ නීත්‍යානුකූල බවට හා එහි ප්‍රකාශිත ප්‍රතිඵලවලට අභියෝග කරමින් අධිකරණයේ නඩු පැවරීය. මෙම නඩුව නිසි විනිශ්චයකට භාජනය කිරීමට ප්‍රථම ශ්‍රී ලංකාව පෙර නුවූ විරූ ස්වභාවයේ ව්‍යසනයකට මුහුණ පෑවේය.

**ජනතා විමුක්ති පෙරමුණ තහනම් කරනු ලබයි. . . . . ප්‍රචණ්ඩත්වය ආරම්භ වෙයි.**

1983 ජුලි මස 21 වන දින මෙරට එකම ගිනිජාලාවක් විය. මෙය සිදුවූයේ බෙදුම්වාදී ත්‍රස්තවාදීන් විසින් යාපනයේදී සන්නද්ධ හමුදා සාමාජිකයින් 13 දෙනෙකු කෲර ලෙස ඝාතනය කරනු ලැබීමෙන් පසුවය. සිංහලයින් වැඩි සංඛ්‍යාංව ලෙස වාසය කළ පෙදෙස්වල සුළු ජාතික ද්‍රවිඩ ජනයාගේ වාසස්ථාන, ව්‍යාපාරික ස්ථාන සහ දේපොල ගිනිබත් කරනු ලැබිණ. වාර්තා ගතනොවුනු ද්‍රවිඩ සිවිල් පුරවැසියන් සංඛ්‍යාවක් ඝාතසික ලෙස ඝාතනය කරන ලදී. උතුරු නැගෙනහිර පළාත්වලින් බැහැරව ජීවත්වූ ද්‍රවිඩ ජාතිකයෝ බොහෝ දෙනා සරණාගතයෝ වූහ. සමහර සරණාගතයින් උතුරු පළාතට ගිය අතර, අනිකුත් අය අසල පිහිටි ඉන්දියාවට පලා ගියහ. යම් ප්‍රමාණයක ප්‍රමාදයකින් පසු ඇඳිරි නීතිය ප්‍රකාශයට පත්කරනු ලැබූ අතර, අනුක්‍රමයෙන් රට සාමාන්‍ය තත්ත්වයට පැමිණියේය.

1983 ජුලි මස 31 වන දින ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය හා නව සමසමාජ පක්ෂය යන පක්ෂ තහනම් කළේය. එම පක්ෂ දෙක එසේ තහනම් කරන ලද්දේ ඒවායේ ක්‍රියාකාරීන් ජාතිවාදී කෝලාහලවලට වගකිවයුතු වන්නේය යන පදනමිනි. බෙහෙවින් ස්වාභාවිකව අපේක්ෂා කළහැකි අන්දමට මෙම පක්ෂ දෙකේම නායකයෝ සැඟවුනහ. මෙම නායකයින් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට නියම කරනු ලැබුවද, ඔවුන්ට එසේ කිරීමට නොහැකි විය. ඉහළම නායකත්වය සැඟවී සිටියදී ක්‍රියාකාරීන් සමහර දෙනෙකු අත්අඩංගුවට ගැනීමට පොලිසියට හැකිවිය. 1983 ඔක්තෝබර් මස 08 වන දින දරන ලිපියෙන් තමන්ගේ පක්ෂය ජනවාර්ගික කෝලාහලයට කිසිත් සම්බන්ධයක් නැතැයි රෝහණ විජේවීර කී අතර, ජනතා විමුක්ති පෙරමුණට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය තුළ ක්‍රියා කිරීමට හැකිවන අයුරු තම පක්ෂය කෙරේ පනවා තිබෙන තහනම ඉවත් කරන ලෙස ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාට ආයාචනය කර සිටියේය.

මේ අතර තුර, පොලිසිය 1987 ජුලි මස සිදුවූ ජාතිවාදී කෝලාහල පැවති කාලයේ සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන විමර්ශණය කළේය. ඒ ඒ විමර්ෂණවල තීරණ පදනම් කොට සැකකරුවෝ අත්අඩංගුවට ගනු ලැබූහ. ඉක්බිතිව ඇටෝර්නි ජනරාල්වරයා වරද කළ බවට ප්‍රමාණවත් සාක්ෂි තිබුණු පුද්ගලයින්ට විරුද්ධව අපරාධ නීති කෘත්‍ය ආරම්භ කළේය. මෙම නඩුවල ප්‍රතිඵලය සිත් ගන්නා සුළු විය. 1983 ජුලි ජාතිවාදී ගැටුම් පැවති කාලයේ ජනතා විමුක්ති පෙරමුණේ හෝ නව සම සමාජ පක්ෂයේ ක්‍රියාකාරීන් අතුරින් එක් අයෙකුවත් ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වූද්දකරුවී නොමැති බව රනිල් වික්‍රමසිංහ මහතාත් සාක්ෂි දෙමින් තමාගෙන් ප්‍රශ්න කළ නීතිඥ තැන සමග එකඟවිය. එහෙයින් ජනතා විමුක්ති පෙරමුණ සහ නව සම සමාජ පක්ෂය 1983 ජාතිවාදී කෝලාහලවලට වගකිවයුතු යයි ඔප්පු කළ නොහැකි විය. එසේ වුවද, ජනතා විමුක්ති පෙරමුණට පැනවූ තහනම තවදුරටත් ක්‍රියාත්මක විය. මේ වනවිට දිස්ත්‍රික් සංවර්ධන සභාවල අසුන් හිමිව සිටි ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිතයින්ට එම සභාවල රැස්වීම් තුනකට පිට පිටම නොපැමිණීම නිසා එම අසුන් අහිමිවී තිබිණ. මෙහි ප්‍රතිඵලය ලෙසට, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ආයතනවල නියෝජනය නොවිණ.

රටෙහි ජනතා විමුක්ති පෙරමුණේ ඒකාග්‍රතාවෙන් යුත් ප්‍රතිසංවිධානයක් සිදුවන බව පොලිසියේ රහස් තොරතුරු සංවිධානවලට 1985 වර්ෂයේ පමණ සිට තොරතුරු ලැබෙමින් තිබී

ඇත. 1960 ගණන්වල අග වර්ෂවලදී මෙන් විශ්ව විද්‍යාලවල ක්‍රියාශීලී දේශපාලන ප්‍රචාරක ව්‍යාපාර ගෙන යාමත්, දේශපාලන ප්‍රචාරක ව්‍යාපාර සංවිධානවීමත් සිදුවිය. මනා ලෙස සංවිධානය කොට ගෙන දිප ව්‍යාප්තව ගෙන ගිය පෝස්ටර් ගැසීමේ ව්‍යාපාරයක් ගෙන යාමෙන් දේශපාලන කරලියෙහි ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීත්වය පැහැදිලිව පෙනෙන්නට තිබිණ. ජනතා විමුක්ති පෙරමුණ පෝස්ටර් බොහොමයක්ම කෙලින්ම රජය කැරවූ එක්සත් ජාතික පක්ෂ රජයට විරුද්ධ ඒවා විය. විවේචනයේ තේමාවන් පක්ෂය තහනම් කිරීමත්, මහජනයා අතර ආර්ථික සම්පත් අයිතියේ තිබෙන පරතරයත් මධ්‍යගත කොටගෙන තිබින. රජය ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකරයද , ඔවුන්ගේ අප්‍රසාදයට ලක්විය. ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීන් විසින් දේශපාලන අරමුණු ඇතිව අපරාධ සිදුකරනු ලබන බවත්, මෙම කාලසීමාව තුලදීම පොලිසියේ රහස් තොරතුරු සේවාවන්ට තොරතුරු ලැබිණ. ප්‍රාරම්භකව සිදුවූ අපරාධ බොහොමයක්ම මංකොල්ලකෑම් හා සොරකම් බඳු ඒවා විය. මෙම අපරාධ කරන්නේ ජනතා විමුක්ති පෙරමුණට අරමුදල් ලබාගැනීමට බවට අනුමාන කරන ලදී. ඉන්පසුව වෙනත් ආකාරයේ අපරාධ ද සිදුවන්නට පටන් ගත්තේය. අවිආයුධ සොරකම් කිරීම හා රජයේ දේපලවලට හානි කිරීම ද ආරම්භ විය. පක්ෂයට සාමාජිකයින් බඳවා ගැනීම ක්‍රියාශීලීව සිදුවිය. ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජාතික පක්ෂ රජයට විරුද්ධව තවත් සන්නද්ධ කැරැල්ලක් ගැසීම සඳහා සූදානම් වන බව තරමක් පැහැදිලිව පෙනෙන්නට වූ අතර, මෙම ප්‍රතික්‍රියාව ඇතිවී තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ අයුක්ති සහගතව තහනම් කරමින් එම පක්ෂය තම අදහස් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමෙන් වැළැක්වීම නිසා යයි යන මතය ඇතැම් දේශපාලන විශ්ලේෂකයින් විසින් පලකරන ලදී. මෙම තත්ත්වය නිසා ඔවුන්ට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රධාන ප්‍රවාහයෙහි යම් කාර්ය භාරයක් ඉටුකිරීමට නොතිබිණ. එකල පැවති රජය විසින් ජනතා විමුක්ති පෙරමුණට මේ ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට බල කරන ලද්දේදැයි දේශපාලන විශ්ලේෂකයෝ ප්‍රශ්න කළහ.

1987 ජූනි මස 04 වන දින ඉන්දියානු ගුවන් හමුදාව විසින් ශ්‍රී ලංකාවේ උතුරට " මානවවාදී ආධාර" හෙළීමේ අපකීර්තිමත් සිද්ධියත් සමග බෙදුම්වාදී එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන්ට විරුද්ධව ගෙන ගිය වඩමාරච්චි මෙහෙයුම අත්හැර දැමීමට රජයට සිදුවිය. 1987 ජූලි මස 29 වන දින ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා ඉන්දියානු අග්‍රාමාත්‍ය රජිව් ගාන්ධි මහතා සමග ගිවිසුමකට පැමිණියේය. " ඉන්දු - ශ්‍රී ලංකා සාම ගිවිසුම" යනුවෙන් හඳුන්වනු ලැබූ මෙම ගිවිසුමට එළඹීමත් සමග රටෙහි ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ලක් ඇති විය. රජයේ ඒ ඒ ආයතන ගිනිබත් කරනු ලැබූ අතර, රජයේ දේපොලවලට හානි කරන ලදී. 1983 ජූලි මාසයේදී මෙන් නොව මෙවර ඉන්දු - ශ්‍රී ලංකා ගිවිසුමට විරුද්ධ වෙනත් බලවේග සමග ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාකාරීන්ද මෙම සිද්ධිවලට සහභාගීවී තිබෙන බව ලබාගැනීමට තිබෙන කරුණු වලින් පැහැදිලිව පෙන්නුම් කෙරේ. එකල පැවති රජය තුල මෙන්ම බාහිරව ද සිටි යම් යම් දේශපාලන බලවේගද මෙම ගිවිසුමට විවෘතවම විරුද්ධ වූ බව සැලකිල්ලට ගතයුතුය. " සාම ගිවිසුමට" එළඹීමට ආසන්නතම වූ කාලයට ප්‍රථම, ජනතා විමුක්ති පෙරමුණ "දේශප්‍රේමී අරගලයක් තුලින් සමාජවාදී විප්ලවයක්" සිදුකිරීම අරමුණු කොට ක්‍රියාශීලී ප්‍රචාරක ව්‍යාපාරයක් ගෙන යමින් සිටියේය. රජය ඉන්දියාවත් සමග ගිවිසුමකට පැමිණීමෙන් පසු ජනතා විමුක්ති පෙරමුණ ඔවුන් කියූ පරිදි " ඉන්දියානු අධිරාජ්‍ය වාදයට" විරුද්ධව එළිපිටම උද්ඝෝෂණය කළේය. ශ්‍රී ලංකාවේ උතුරින් ඉන්දියානු සාමසාධක හමුදාව ආපසු කැඳවා ගතයුතු යයි ඔවුහු උද්ඝෝෂණය කළහ. ඒ වන විට, අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මහතාත්, ඉන්දියානු සාමසාධක හමුදාව මෙරට සිටීම ගැන විරුද්ධ බව පුළුල් ලෙස පිළිගනු ලැබිණ. ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරණ ඡන්ද ව්‍යාපාරය තුලදී එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා වූ ප්‍රේමදාස මහතා තමා මෙරට

ජනාධිපතිවරයා වූ විට ඉන්දියානු සාමසාධක හමුදාව ආපසු යවනු ලැබීම සහතික කරන බව එළිපිටම කීය. "එල්.ටී.ටී.ඊ සංවිධානය හා ජනතා විමුක්ති පෙරමුණ ඔවුන්ගේ අරගලවල දිගටම යෙදී සිටින්නේ ඔවුන් සමාජ හා දේශපාලන අසාධාරණකම්වලට ගොදුරුවී සිටින නිසා යයි" පසුව 1988 අප්‍රේල් මාසයේදී ප්‍රකාශ කරමින් අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මහතා එසේ කී බවට වාර්තාගත විය.

1987 අගෝස්තු මාසයේ සිට රටේ ආරක්ෂක තත්ත්වය අනුක්‍රමිකව හා අඛණ්ඩව පිරිහිණ. දේශපාලනඥයින්ගේ ජීවිතවලට බරපතල තර්ජනයක් එල්ලවිය. ප්‍රධානම ඉලක්ක වූයේ රජය කරවූ එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනඥයෝය. සම්ප්‍රදායික වාමාංශික පක්ෂවල නායකයෝ ද මෙම තර්ජනවල ඉලක්ක විය. ඉහළ මට්ටමේ දේශපාලනඥයින් හැරුණු විට, සාමාන්‍ය පොදු ජනතාව අතර වූ දේශපාලන හිතවත්තු ද තර්ජනවල ඉලක්ක බවට පත්වූවෝය. එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයින් 1960 දෙනෙකු පමණ ඝාතනය කරනු ලැබූ බව ඇස්තමේන්තු කර තිබේ. ඔවුන් අතර අනුගාමීව තනතුරු ලැබූ එක්සත් ජාතික පක්ෂ ලේකම්වරු දෙදෙනෙක් වන හර්ෂ අබේවර්ධන ( මොහු 1987.12.23 වන දින ඝාතනය කරන ලදී.) හා නන්දලාල් ප්‍රනාන්දු යන මහත්වරුද, එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විසි දෙනෙක් ද වූහ. තවද, මොවුන්ගේ ප්‍රහාරවලට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීහු ද ඉලක්ක බවට පත්වූහ. එවකට ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියා ගැන රහස් තොරතුරු එක්රැස් කිරීමේ නිරතව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ක්ලැරන්ස් පෙරේරා මහතා ජනතා විමුක්ති පෙරමුණ විසින් ඝාතනය කරනු ලැබිණ. ඉන්පසුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බෙනට් පෙරේරා මහතා ද ( මොහු කඩාකප්පල් කාරී ක්‍රියා ගැන විමර්ශණ කිරීම ගැන හද උනන්දුවක් දැක්වූ නිලධාරියෙකි.) ඝාතනය කරන ලදී. රජයේ දේපළවලට සිදුකරන ලද හානිය බිය උපදවන තරමින් විශාලය. පර්යන්ත ප්‍රදේශවල පිහිටි රජයේ ආයතන ගිනිබත් කරන ලදී. තවත් සැලකියයුතු ලක්ෂණයක් වූයේ රජයේ සංවිධාන තුළ මැනවින් සංවිධානය කරන ලද වැඩවර්ජන පැවැත්වීමය. අත්‍යවශ්‍ය සේවා අක්‍රිය තත්ත්වයටම වාගේ පත්කළ එක් වැඩ වර්ජනයක් නම් ජාතික ප්‍රවාහන සේවකයින් විසින් දියත් කළ වැඩ වර්ජනයයි. තවත් නොයෙක් රජයේ ආයතනවල අනුක්‍රමයෙන් වැඩ කටයුතු නතර විය. මෙය සිදුවූයේ " දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය (D.J.V.) " නමින් හැඳින්වුනු සංවිධානයක් විසින් එම ස්ථානවලට යැවුනු තුණ්ඩු කැල්ලකින් දුන් නියෝග සමගය. මෙම වැඩ වර්ජන සමග එම සංවිධානය විසින්ම ප්‍රකාශයට පත්කරන ලදැයි කියවුනු ඇත්ත වශයෙන්ම වූ ඇඳිරි නීති නියෝගද ක්‍රියාත්මක විය. "දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ" නියෝග නිකුත් කරනු ලැබුයේ "කීර්ති විජයබාහු" යන නමක් යටතේය. මෙහි ප්‍රතිඵලය ලෙසට රට තුළ අරාජික තත්ත්වයක්ම බඳු තත්ත්වයක් පැවතිණ.

නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න මහතාගේ සාක්ෂි උපයෝගි කරගෙන තත්ත්වය සම්පිණ්ඩනය කර දක්වතොත්, රටේ පැවති තත්ත්වය " අතිවිශේෂ" එකක් විය. මෙම අති විශේෂ තත්ත්වය මැඩලීම සඳහා " අති විශේෂ ක්‍රියා මාර්ග ගතයුතු වී යයි" ඔහු තවදුරටත් කීය. සාක්ෂිකරු මෙම වචන ප්‍රකාශ කළ අවස්ථාවෙහි ඔහු අදහස් කළේ කුමක් වියහැකිද යන්න අපි යථා කාලයේදී විශ්ලේෂණය කිරීමට නැත් කරන්නෙමු.

## ප්‍රතිවිරුද්ධ පියවර:

මෙරිල් ගුණරත්න හා නලින් දෙල්ගොඩ යන නියෝජ්‍ය පොලිස්පතිවරුන් දෙදෙනාම කියන අන්දමට ඉහත සඳහන් ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ලේ ආරම්භයේදී එම ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදුනවුන්ට විරුද්ධව පොලිසිය ලවා කාර්යක්ෂමව ප්‍රතිචාර දක්වන්නට සැලැස්වීම දුෂ්කර විය. ඔවුන්ට අනුව ඊට ප්‍රධානම හේතුව එම පොලිස් නිලධාරීන් එම ක්‍රියාවල යෙදුනවුන්ට බියවීමය. කණිෂ්ඨ පොලිස් නිලධාරීන් අතුරින් සමහර දෙනා ත්‍රස්තවාදීන්ගේ උද්ඝෝෂනයේ තේමාවන්ට එකඟවීම ඔවුන්ගෙන් පළවුනු අක්‍රියශීලී බවට තවත් හේතුවක් වන්නට ඇත යන්න දේශපාලන විශ්ලේෂකයින්ගේ මතය වී තිබේ. " ඉන්දියානු අධිරාජ්‍යවාදය නැවැත්වීම " , "ආර්ථික සම්පත් බෙදී යෑමේ සමානත්වයක් ඇති කිරීම", " ඉන්දියානු සන්නද්ධ හමුදා ආපසු යැවීම", ජනවාර්ගික ප්‍රශ්ණය විසඳීම, මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ස්ථාපනය කිරීම යන මේවා මෙම තේමාවන්ගෙන් සමහරකි.

1988 අග භාගයේදී ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන ක්‍රියාශීලී දේශපාලනයෙන් විශ්‍රාම ගත් අතර, 1988 නොවැම්බර් මාසයේදී ජනාධිපතිවරණයක් පවත්වන ලදි. ජනාධිපති තනතුර සඳහා තරඟ වැදුනු ප්‍රධාන තරඟකරුවන් වූයේ රණසිංහ ප්‍රේමදාස මහතා ( එක්සත් ජාතික පක්ෂ රජයේ අග්‍රාමාත්‍යවරයා), සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ( කලක් ප්‍රජා අයිතිවාසිකම් අහිමි කොට සිට මෑතදී එම අයිතිවාසිකම් හිමිවූ හිටපු අග්‍රාමාත්‍යවරිය) සහ ( එක්සත් සමාජවාදී පෙරමුණේ අපේක්ෂක) ඔසී අබේගුණසේකර මහතාය. ප්‍රචලිතව පැවති ප්‍රචණ්ඩ ක්‍රියා හා බියගැන්වීම් අතර තුරේම ජනාධිපතිවරණය පවත්වනු ලැබිණ. මෙහිදී රණසිංහ ප්‍රේමදාස මහතා ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා ලෙස ජන්දයෙන් තේරී පත්වූ බව ප්‍රකාශයට පත්කරනු ලැබිණ. පාවිච්චි වූ ජන්ද සංඛ්‍යාවෙන් ඔහු ලබාගත් ජන්ද ප්‍රමාණය 50.43% කි. එම ජනාධිපතිවරණය පැවැත්වූ විගසින්ම 1989 පෙබරවාරි මාසයේදී මහා මැතිවරණයක් පැවැත්වූ අතර, එහිදී එක්සත් ජාතික පක්ෂයට පාර්ලිමේන්තු ආසන 196 න් ආසන 125ක් ලැබිණ. ඩී.බී. විජේතුංග මහතා අග්‍රාමාත්‍යවරයා ලෙසත්, රන්ජන් විජේරත්න මහතා ජාතික ආරක්ෂක අමාත්‍යවරයා හා රාජ්‍යාරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත් පත්කරනු ලැබූහ. කඩාකප්පල්කාරීන්ගෙන් එල්ලවූ තර්ජනය මෙල්ල කිරීමේ කටයුත්ත භාර වූයේ විජේරත්න මහතාටය.

මෙම· කාලය තුළදී දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් නිකුත් කරන ලදැයි කියවුනු පෝස්ටර් මාලාවක්ම රට පුරා ප්‍රදර්ශණය කරනු ලැබිණ. සියළුම සන්නද්ධ හමුදා හා පොලිස් සේවා· සාමාජිකයින් ඉල්ලා අස් වියයුතු යයි එම පෝස්ටර් වලින් ඉල්ලා තිබිණ. ඔවුන් එසේ ඉල්ලා, අස් නොවුනහොත් ඔවුන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් මරණයට පත්කරන බවට එම පෝස්ටර් වලින් තර්ජනය කර තිබිණ. ඇත්ත වශයෙන්ම මෙම පෝස්ටර් ප්‍රදර්ශනය වීමෙන් පසු පොලිස් නිලධාරීන් විසි දෙනෙකු හා ඔවුන්ගේ පවුල් ඝාතනයට ලක්විය. නලින් දෙල්ගොඩ කියන අන්දමට, කඩාකප්පල්කාරීන්ට විරුද්ධව ගෙන යන ව්‍යාපාරයට එයින් පසු පොලිස් නිලධාරීන්ගේ සහාය ලබාගැනීම පහසු විය. පොලිස් නිලධාරීන් කැළඹීල්ලට පත්ව කෝපයට පැමිණි හෙයින් කඩාකප්පල්කාරීන්ට විරුද්ධව සටන ගෙනයාමට ඉදිරිපත්වූ අය එන්ට එන්ටම වැඩිවිය.

1980 වර්ෂවල අග භාගයේ සිට කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකක පොලිස් කොට්ඨාසවල පිහිටුවනු ලැබිණ. කඩාකප්පල්කාරී ක්‍රියා සම්බන්ධ රහස් තොරතුරු එක් කොට ගෙන අධ්‍යයනය කිරීම, විමර්ශණ පැවැත්වීම, සැකකරුවන් අත්අඩංගුවට ගැනීම හා ත්‍රස්තවාදී මර්දන ක්‍රියා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම, ඒවායේ ප්‍රධාන නිල රාජකාරී විය. කාර්යභාර නිලධාරීන් යටතේ මෙම ඒකක පැවති අතර ඒවා අයත් වූයේ සහකාර පොලිස් අධිකාරීවරුන්ගේ විෂය පථයටය. එම සහකාර පොලිස් අධිකාරීවරුන් සහකාර පොලිස් අධිකාරී ( මෙහෙයුම්) යනුවෙන් හඳුන්වනු ලැබූහ. මෙම ඒකක පිහිටුවනු ලැබුයේ ඒ ඒ පොලිස් කොට්ඨාසවල ප්‍රධාන පොලිස් ස්ථානයේ ය. මෙම ඒකකවල නිලධාරීන්ට සිවිල් ඇඳුම්වලින් සැරසී ක්‍රියාත්මකවීමට බලය දෙනු ලැබිණ. මේ අනුව එම නිලධාරීන් ස්ථිරව පාවිච්චි කරන පොලිස් වාහනවලින් පමණක් නොව සිවිල් ලක්ෂණ දැරූ පවරාගත් වාහනවලද ගමන් කළහ. මෙම වාහන සමහරකට නිසි ලියාපදිංචි කළ අංක නොතිබුණු බවත්, ඒවායේ තිබුණේ "ගරාජ අංක" බවත් පරීක්ෂණ කටයුතුවලදී හෙළිදරව් විය. මෙම තත්ත්වය නිසා එබඳු වාහන නිත්‍ය වශයෙන් හඳුනාගැනීම දුෂ්කර විය. කඩාකප්පල්කාරීන්ගෙන් එල්ලවූ තර්ජනය කාර්යක්ෂමව මර්දනය කිරීමට හැකිවූයේ ඒ ඒ ප්‍රදේශවල කඩාකප්පල්කාරී මර්දන ඒකකවලට බව කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සියළුම පොලිස් නිලධාරීන් ගෙන සිටි ස්ථාවරයයි.

1980 දශකයේ අග භාගයෙහි තරුණ තරුණියන් පෙර නොවූ විරූ තරමින් විශාල සංඛ්‍යාවක් අතුරුදහන්වීම ශ්‍රී ලංකාවේ දක්නට ලැබිණ. මෙයින් සමහර දෙනා පැහැර ගෙන යනු ලැබීමට සම්බන්ධ සාක්ෂි තිබුණ නමුත් අතිබහුත් බොහෝ දෙනාට සිදුවූයේ කුමක්ද යන්න ගැන කිසිත් හෝඩුවාවක් නොතිබිණ. පැහැරගෙන යනු ලැබූ බොහෝ පුද්ගලයෝ සදහටම අතුරුදහන් වූහ. සමහරක් අවස්ථාවල ටික කලකට පසු, පැහැරගෙන යනු ලැබූවන්ගේ වෙඩි උණ්ඩ වලින් සිදුරුව ගිය හෝ පිළිස්සී ගිය මළ සිරුරු හමුවිය. මෙසේ ජීවිතක්ෂයට පත්කරන ලද හා අතුරුදහන්වූවන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව 40,000ක් පමණ වේ යයි නිල නොවන ඇස්තමේන්තුවලින් පෙන්නුම් කෙරේ. පැහැරගෙන යනු ලැබූ ඉතාම ටික දෙනෙකු පමණක් රජයෙන් පවත්වනු ලබන රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා සිටින බවටත්, තවත් ඇතැම් අය නිල නොවන රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා සිටින බවටත් සෑහෙන තරම් දීර්ඝ කාලසීමාවකට පසු ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට දැනගන්නට ලැබිණ. මෙම පරීක්ෂණයේ ප්‍රධාන අංශය අදාළ වන්නේ "බටලන්දේ පිහිටි එබඳු නිල නොවන හා නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථානයකටය".

මෙම කාලසීමාවේදී (ජනතා විමුක්ති පෙරමුණ හැරුණු විට) අනිකුත් විපක්ෂ දේශපාලන කණ්ඩායම්වල පුද්ගලයින්ද කඩාකප්පල්කාරීන් මර්දනය කිරීමේ මුවාවෙන් හිංසා පීඩාවලට ඉලක්ක වන බවට පැමිණිලි ලැබීම එන්ට එන්ටම වැඩිවිය. එබඳු පැහැරගෙනයෑම්/අතුරුදහන්වීම් සම්බන්ධයෙන් එවකට පැවති විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ අවස්ථාවලදී පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළ බව සාක්ෂිවලින් කියැවිණ. ප්‍රධාන චෝදනාව වූයේ තම දේශපාලන විරුද්ධවාදීන්ගෙන් " නිදහස්වීමට" රජයේ දේශපාලනඥයින් පොලිස් නිලධාරීන් පාවිච්චි කරන බවය. රට කරවූ එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් දේශපාලනඥයින් සමග ඇතැම් පොලිස් නිලධාරීන් පැවැත්වූ සමීප ආශ්‍රය නිසා මෙම චෝදනාව එල්ලවීමට පැහැදිලි පදනමක් පැවතියාක් මෙන් පෙනෙන්නට තිබේ. රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් බටලන්ද නිවාස සංකීර්ණයේ නිවාස දෙකක පැවැත්වූ රැස්වීම් මාලාවක් ගැන සාක්ෂිවලින් ප්‍රකාශ විය. මෙම රැස්වීම්වලට, එම ප්‍රදේශයේ තෝරාගත් පොලිස් නිලධාරීන් සමූහයක්, සුරනිමල රාජපක්ෂ බඳු එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනඥයින් ටිකදෙනෙකු සමග සහභාගිවූ බව එම

සාක්ෂිවලින් කියැවින. මෙරිල් ගුණරත්න, නලින් දෙල්ගොඩ, ඩග්ලස් පීරිස්, රාජා ඩයස් වැනි පොලිස් නිලධාරීන් එම රැස්වීම්වලට සහභාගිවූ බව කවුරුත් පිළිගත්හ. මෙම රැස්වීම්වල ප්‍රධාන ලක්ෂණ පිළිබඳව ඒකාකාර සාක්ෂිදීමට ඉහත සඳහන් පුද්ගලයින්ගෙන් කිසිවෙකුටවත් පුළුවන් වූයේ නැත. හැම පුද්ගලයකුගේ සාක්ෂි අනිකුත් අයගේ සාක්ෂි හා පරස්පර විරෝධී විය. මෙම රැස්වීම්වල වාර්තා හෝ සටහන් කිසිවක් තබා ගෙන නැත. මෙම රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද මාතෘකා පිළිබඳ සාක්ෂි එතරම් පැහැදිලි නැත. කුමක් නිසාද යත්, සාක්ෂිකරුවන් ඒ පිළිබඳව දුන් සාක්ෂි පරස්පර විරෝධී වූ බැවිනි. නලින් දෙල්ගොඩ මහතා කියන අන්දමට මෙම රැස්වීම්වල පරමාර්ථය වූයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන කටයුතු ගැන රනිල් වික්‍රමසිංහ මහතා විසින් ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට " දේශපාලන නායකත්වය" දීම හා "නියමයන්" කිරීමය. කෙසේ වුවද " කර්මාන්ත අමාත්‍යවරයාට" පොලිස් නිලධාරීන් සමග කුමක් කිරීමට නීතියෙන් අපේක්ෂිතව තිබුනේද යන්න ගැන සාක්ෂිකරුට පැහැදිලි කිරීමක් කල නොහැකිවිය. මෙම විෂය ගැන පසුව එන පරිච්ඡේදයකදී තවදුරටත් කරුණු කියැවෙනු ඇත. සැළකිල්ල යොමු වියයුතු කරුණ නම්, පාලක පක්ෂයේ දේශපාලනඥයින් පළාතේ පොලිස් නිලධාරීන් සමග කිට්ටු සබඳතා පැවැත්වූ බවත්, එම සබඳතා පදනම් කොට කුමක් සිදුවුයේද යන්න එතරම් පැහැදිලි නැති බවත්ය.

## ජනතා විමුක්ති පෙරමුණ පාලනය කරනු ලබයි.

1989 වන විට රජය නායකත්වය දී ගෙන ගිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන මෙහෙයුම් උච්චතම අවස්ථාවට පැමිණ තිබිණ. පොලිසියේ හා සන්නද්ධ හමුදාවල විවිධ සංවිධානවලට අමතරව, යම් යම් වෙනත් කණ්ඩායම් ද ක්‍රියාකාරී වෙමින් තිබිණ. මෙම කණ්ඩායම්වලට පොදුවේ " සෝදිසි කණ්ඩායම් " කම්ටු යන නම දී තිබිණ. එක් එක් නම වෙන වෙනම සඳහන් කරතොත්, "ප්‍රා", "කොළ කොටි", "කළු බලල්ලු", " දිවි මකුළුවා", " කහ බලල්ලු" යන නම් වලින් ඒවා හඳුන්වනු ලැබිණ. මෙම කණ්ඩායම්වල ප්‍රධාන කාර්ය වූයේ කඩාකප්පල්කාරී සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඔවුන් විනාශ කිරීම බව පැහැදිලිය. මෙරිල් ගුණරත්න හා නලින් දෙල්ගොඩ යන දෙදෙනාගේම සාක්ෂිය වූයේ, මෙම කණ්ඩායම්වල සාමාජිකයින්ගේ නීති විරෝධී කියා ගැන පොලීසිය විසින් ඔවුන් අත්අඩංගුවට ගත් එක් අවස්ථාවක්වත් ඔවුන් නොදන්නා බවය. මෙම කණ්ඩායම්වලට පොලිසියේ අනුග්‍රහය ලැබුණේය යන්න ඇත්ත වශයෙන්ම, කොමිෂන් සභාවට ඇතිවූ පැහැදිලි හැඟීමයි. එහෙයින් මෙම කණ්ඩායම්වල සාමාජිකයින් හඳුනාගැනීම ඉතාම වැදගත් විය. මෙම කණ්ඩායම්වල සාමාජික සමූහයා විමසා දැනගැනීමෙන් මෙම කණ්ඩායම් හඳුනාගැනීමට කොමිෂන් සභාව තැත් කලේය. මෙම කාරණය ගැන තියන සාක්ෂියක් කලින් කැබිනට් අමාත්‍යවරයකුව සිටි වත්මන් එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝන් අමරතුංග මහතාගෙන් ලැබිණ. අමරතුංග මහතා කියන අන්දමට, ඔහු ( අමරතුංග මහතා) තුළ පැවති විශ්වාසය නම් කළු බලල්ලු ශ්‍රී ලංකා පොලීසියේම සංවිධානයක් බවයි. අමරතුංග මහතාට එසේ විශ්වාස කිරීමට නිශ්චිත හේතු තිබෙන්නට ඇත. එසේ වුවද, ඔහුගේ කැබිනට් සගයන් වන රනිල් වික්‍රමසිංහ මහතා හා ජෝෂප් මයිකල් පෙරේරා මහතා එම අදහසට එකඟවීම ප්‍රතික්ෂේප කළහ. කොමිෂන් සභාව විසින් බටලන්ද නිවාස යෝජනා ක්‍රමය පරීක්ෂා කල අවස්ථාවෙහි ඩග්ලස් පීරිස් මහතාගේ නිවස ඉදිරිපිට වූ නිවසක ජනේලවල හා බිත්තිවල ( නිවසේ පීරිස් මහතාගේ ආරක්ෂක නිලධාරීන් නවතා සිටින ලදැයි ඔප්පුවී තිබිණ.) " කළු බලල්ලු" යන වචන ලියා තිබිණ. 1988 - 1990 කාලසීමාවේ මෙම ඉහතින් සඳහන් නම දී තිබුණු බව ඇත්ත වශයෙන්ම කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශවූ සාක්ෂිවලින් පැවසිණ. මෙම

"සෝදිසි" කණ්ඩායම්වල නීති විරෝධී ක්‍රියාවලට හේතු දැක්වීමක් නොකෙරිණ. ඒවාට රටේ සාමාන්‍ය නීතිය ක්‍රියාත්මකවීමෙන් මුක්තියක් තිබිණ. මෙම කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය හා ඇතැම් පොලිස් ඒකකවල ක්‍රියාකාරිත්වයේ ස්වභාවය, " ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදය රජයේ සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ත්‍රස්තවාදයෙන් හා " සෝදිසි " කණ්ඩායම් විසින් සිදු කෙරුණු ත්‍රස්තවාදයෙන් මෙල්ල කරනු ලැබූ බවට" වූ චෝදනාව එල්ල කිරීමට ආයක වන බව එවකට වූ පොලිස්පති විසින් පිළිගන්නා ලදී.

1990 දී නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීහු ජනතා විමුක්ති පෙරමුණට විරුද්ධ සිය සටනෙහිලා ලොකු ප්‍රගතියක් ලබාගත්තෝය. ඔවුන්ට ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය අත්අඩංගුවට ගැනීමට හැකිවිය. පක්ෂයේ නායක රෝහණ විජේවීර හා පක්ෂයේ ලේකම් උපතිස්ස ගමනායක ඒ අතර වූහ. එසේ එක් එක් පුද්ගලයා අත්අඩංගුවට ගැනීමෙන් සුළු කාලයක් ඇතුලතදී පුද්ගලයෝ දෙදෙනාම පොලිස් හමුදා භාරයේ සිටියදී අභිරහස් තත්ත්වයන් යටතේ මරණයට පත්වූහ. නායකත්වය අල්ලා ගැනීමත්, පක්ෂ ක්‍රියාකාරීන් විශාල වශයෙන් අල්ලා ගැනීමත් සමග ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකම් අඩුවන්නට විය.

තමන්ට කුමක් සිදුවිය හැකිද යන්න ගැන තිබූ බිය නිසා ඇතැම් සාමාජිකයෝ පොලිසියට යටත් වන්නට විය. 1990 ගණන්වල අන්තිමේදී කඩාකප්පල්කාරීන් ගෙන් එල්ලවූ තර්ජනය අවසන්වූ බව අවිවාදාත්මකය. කෙසේ වුවද, කඩාකප්පල්කාරීන් මෙන්ම කඩාකප්පල්කාරී ක්‍රියා මාර්දන කණ්ඩායම් විසින්ද දියත් කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියාවලින් සමාජයට ඇතිවූ තුවාල සුව නොවී කලක් පැවතින. 1987 සිට 1990 දක්වා වූ කාලසීමාව " භීෂණ සමය" නමින් හඳුන්වනු ලැබිණ. මෙම කාලසීමාවේදී විශාල වශයෙන් සිදුවූ පුද්ගලයින් අතුරුදහන්වීමත් කෲර මිනිස් ඝාතනත් නිසා, ශ්‍රී ලංකාව ලෝකයේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය සුලබව සිදුවන ප්‍රධාන රටවල් අතුරින් ප්‍රමුඛ රටක් ලෙසට අපකීර්තියක් ලැබීය. එම කාලසීමාව තුළදී, මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ධෛර්යය දීම හා ඉවසීම ගැන ජාත්‍යන්තර සංවිධාන ශ්‍රී ලංකා රජයට චෝදනා නගන්නට විය. පුරවැසියන්ට සිදුවූ දේ ගැන රජය වගකිවයුතුයයි කියන ලදී. එක් අවධියකදී මානව හිමිකම් නිරීක්ෂණයෙහි යෙදුනෝ තත්ත්වය නිරීක්ෂණය සඳහා ශ්‍රී ලංකාවට එවනු ලැබූහ. විශේෂයෙන්ම පොලිස් භාරයේ සිටින සැකකරුවන්ට සලකන ස්වභාවය ගැන පරීක්ෂාකාරීව සිටීම ඔවුන්ගේ අරමුණ විය. මෙම මානව හිමිකම් රැකීමේ ව්‍යාපාරයේ ක්‍රියාකාරීන් පැමිණි ගමන්වල සමහර බලපෑම් ගැන පසුව කරුණු සඳහන් කරනු ලබනවා ඇත.

ඉහතින් සඳහන් කරන ලද කාරණා ගැන කරුණු සඳහන් කිරීම අවශ්‍ය යයි අප විසින් සලකන ලද්දේ අධිකාර පත්‍රයේ අඩංගු නිර්ණේය විෂයයන් ගැන කෙරෙන විමර්ශන එම කාරණා සමග අවියෝජනීය ලෙසින් බැඳී තිබෙන බැවිනි. අදාල සිද්ධීන් සිදුවූ පසුබිම කෙරෙහි නිසි සැලකිල්ල නොදක්වා නිර්ණේය විෂයයේ සඳහන් කරුණු වෙන් වෙන් වශයෙන් ගෙන පරීක්ෂණ කටයුතු කළ නොහැකි නිසාය.